**ශීර්ෂය 322 ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 21 වන දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 21 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර පොත් අනුව රු. 255,459 ක් වූ පරිගණක මෘදුකාංග ශේෂය, ACA-06 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | දෙපාර්තමේන්තු ගිණුම් වලින් ඉවත් කර ඇති නමුත් CIGAS වැඩසටහනින් වැරදි ලෙස ගිණුම් ගතවී ඇති බවත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් සිදු කර විගණනයට දන්වා එවීමට කටයුතු කරන බව. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ACA-06 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම සහ SA 82 භාණ්ඩාගාර පොත් අනුව ශේෂය අතර රු. 32,260,312 ක වෙනසක් පැවතුණි. | නව CIGAS වෙබ් අඩවියට දත්ත උත්පනය කිරීමේදී ඇතිවූ තාක්ෂණික දෝෂයක් හේතුවෙන් මෙම වෙනස වත්කම් ගිණුමේ පෙන්නුම් කරන බව හා දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය නිවැරදි බවත්, ඊට අනුකූලව CIGAS වෙබ් අඩවියට ඇතුලත් කරන දත්ත නිවැරදි කිරීමට කටයුතු කරන බව. | භාණ්ඩාගාර පොත් සමග සසඳා නිවැරදිව ගිණුම් පවත්වාගෙන යා යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් ලෙස රු. 37,913,538 ක් දක්වා තිබුණි. ඒ තුළ යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්, අමුද්‍රව්‍ය මිලදී ගැනීම්, කොන්ත්‍රාත් වැටුප්, අතිකාල හා ගමන් වියදම් දීමනා, විදුලිය, ජලය හා දුරකථන බිල්පත් සහ ආරක්ෂක හා සනීපාරක්ෂක වියදම් ලෙස රු. 30,526,815 ක් ඇතුළත් විම හේතුවෙන් එම වටිනාකම අපහරණයන් ලෙස ACA-06 මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් අඩුකර දක්වා තිබුණි. එසේ අපහරණයන් යටතේ දක්වා තිබූ වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පුනරාවර්තන වියදම් මිරිජ්ජවිල, ගම්පහ, අවිස්සාවේල්ල යන උද්‍යානවල උප ව්‍යාපෘතිවල ඉඩම් වැඩි දියුණු කිරීම සඳහා කරන ලද කාර්යයන් වෙනුවෙන් දරන ලද වියදම් බවත් එමගින් උද්‍යාන වැඩි දියුණු කිරීමක් සිදුවන නමුත් ඉඩම් හා ගොඩනැගිලිවල වත්කම් වටිනාකම ගිණුම් ගත කරනුයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන තක්සේරු වටිනාකම් අනුව බවත්, CIGAS වැඩසටහන මගින් ගිණුම්ගත කිරීමෙදී මෙම ගනුදෙනු ඉඩම් මිලදී ගැනීමක් ලෙස වත්කම් ගිණුමේ සටහන් වන බැවින් එය නිවැරදි කිරීම සඳහා අපහරණයන් ලෙස දක්වා ඇති බව. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට උද්‍යානවල ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී ගිණුම්ගත නොකළ ස්ථාවර වත්කම් අයිතම 881 ක් පැවතුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණ පිළිගන්නා අතර 2021 ජූනි 30 දිනට පෙර වත්කම් තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු ද සම්පාදනය කරමින් පවතින බව. | වත්කම් නිවැරදිව හදුනාගෙන ගිණුම් ගත කළ යුතු වීම. |
| (ඉ) | උද්‍යාන භාර අරමුදලේ වත්කම් ලෙස 2010 වර්ෂයේ සිට උද්භිද උද්‍යානභාර අරමුදල යටතේ හදුනාගෙන තිබූ රු.779,371,034 ක වත්කම් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් වත්කම් විය. ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම් සහ ඉඩම් සංවර්ධන වැඩ CIGAS වැඩසටහනට අලුතින් ඇතුළත් කිරීමට නොහැකි වීම, පුස්තකාල පොත් ඇතුළත් කිරීමට කාණ්ඩයක් නොමැති විම සහ ඇතැම් වත්කම් ද්විගණනය වීම හෝ වෙනත් දෝෂ පවතීද යන්න පරීක්ෂා කළ යුතු වීම වැනි හේතූන් මත එම වත්කම්වලින් එකතුව රු.515,856,117 ක් වූ වත්කම් CIGAS වැඩසටහනට ඇතුළත් කර නොතිබුණි. | පැවති ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම් සහ ඉඩම් සංවර්ධන වැඩ සඳහා වූ වටිනාකම් පවතින වත්කමේ වටිනාකම වැඩිවීමක් ලෙස CIGAS වැඩසටහනට ඇතුළත් කිරීමට හැකියාවක් නොමැති වීමත්, පුස්තකාල පොත් ඇතුලත් කිරීමට කාණ්ඩයක් නොමැතිවීම යන කරුණු මත එම වටිනාකම් CIGAS වැඩසටහනට ඇතුළත් කිරීමට නොහැකිවී ඇති බවත්, වත්කම් ද්විගණනය වීම් හෝ වෙනත් දෝෂ ඇතිද යන්න උද්‍යානභාර අරමුදලේ තොරතුරු සමග පරීක්ෂාකර නිරවද්‍ය බව තහවුරු කරගෙන ඇති බවත්, එම වත්කම් CIGAS වැඩසටහනේ දැනට ඇතුලත්ව ඇති වත්කම් සමග එකින් එක පරීක්ෂාකර නිරවද්‍යතාවය තහවුරු වූ පසු ඇතුලත් කළ යුතුව ඇති එම කාර්යය තරමක් කල් ගතවන කාර්යයක් වන අතර, මේ වනවිට එම පරීක්ෂා කිරීම් සිදු කරමින් පවතින බව. | -එම- |

**1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා සහනාධාර හා මාරු කිරීම් රු.65,370,503 ක් වුවත්, දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට රු.81,166,169 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු.15,795,666 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය නිවැරදිව දක්වා ඇති බවත් පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් රු.489,215,172 ලෙසත් සහනාධාර හා මාරු කිරීම් රු.1,919,635 ලෙසත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදි කර මේ සමග ඉදිරිපත් කරන බව. | මෙහෙයුම් ක්‍රියාකාරකම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් රු.516,119,020 ක් වුවත්, දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් ලෙස රු.409,968,638 ක් සටහන් කිරීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු.106,150,382 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් ලෙස රු.516,119,020 නොව රු. 489,215,172 ක් විය යුතු බවත් ඒ අනුව සකස් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පිටපතක් මේ සමග ඉදිරිපත් කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනිම් ලෙස මුළු මුලධන වියදම වූ රු. 128,268,255 ක් දක්වා තිබුණි. නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් ලෙස දැක්විය යුත්තේ රු 37,913,538 ක් වූ මුලධන වත්කම් අත්පත් කර ගැනීමෙ වටිනාකමයි. ඒ අනුව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 90,354,718 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහය අයවැය ලේඛනයේ වර්ගීකරණය අනුව සකස් කර ඇති බව. | ආයෝජන ක්‍රියාකාරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. |

**1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ගිණුමේ දක්වා ඇති දෙපාර්තමේන්තු සේවයේ නියුතු නිලධාරින්ගේ ආපදා ණය ශේෂත් සාමාජික ණය ලේඛණය (CC 10) අනුව ණය ශේෂත් අතර රු. 2,330,973 ක වෙනසක් පැවතුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති වෙනස පැවති බව පිළිගන්නා බවත් අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ශේෂය සහ සාමාජික ණය ලේඛනයේ කේවල ණය ශේෂයන් සමාන විය යුතු වීම. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ණය සහ අත්තිකාරම් ලේඛනය** | | |
| | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණය හා අත්තිකාරම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | අදාළ ලේඛන ඉදිරියේදී නිවැරදිව පවත්වාගෙන යාමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සාමාජික ණය ලේඛනය හා ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | **වනෝද්‍යාන ගස් ලේඛනය** | | |
| | උද්භිද උද්‍යානයක පවත්වාගත යුතු ප්‍රධානතම ලේඛනයක් වන වනෝද්‍යාන ගස් ලේඛනය ගම්පහ උද්භිද උද්‍යානය, මීගලෑව, හරිත පියස පුහුණු මධ්‍යස්ථානය, සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය විසින් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | උද්භිද උද්‍යානය තුල පවතින සියලුම ශාක එක් ලේඛනයක පවත්වාගෙන යාමට කටයුතු කර ඇති බව. | වනෝද්‍යාන ගස් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.11 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දි නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ක්‍රියාකාරකම් ඵලදායීව පාලනය කර ගැනීම සඳහා මාසිකව උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අවශ්‍ය අක් මුදල් ප්‍රමාණය සැලැසුම් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මැයි මස සිට දෙසැම්බර් මස දක්වා අග්‍රිම සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2020 මැයි සිට දෙසැම්බර් දක්වා මාසික අග්‍රිම සැලැස්ම සකස් කිරීමට අතපසු වී ඇති බවත් අවස්ථානුකූලව රටේ පැවති තත්ත්වය අනුව මාසික අග්‍රිම ඉල්ලුම්පත්‍රය මගින් අග්‍රිම ඉල්ලුම් කර අවශ්‍ය කටයුතු ඉටු කර ඇති බව. | දෙපාර්තමේන්තුවට අවශ්‍ය අක් මුදල් ප්‍රමාණය සැලැසුම් කළ යුතු වීම. |

**2.2 ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 85(1)(ඇ) සහ මුදල් රෙගුලාසි 143(1) ප්‍රකාරව එකතු කිරීමට තිබෙන මුදල් හැකිතාක් දුරට නිවැරදිව තක්සේරු කළ යුතුය. එමෙන්ම භාණ්ඩාගාර ලේකම්ගේ 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 වන ඡේදය ප්‍රකාරව ඉතා නිවැරදිව පුරෝකථනය කළ යුතු වේ. එසේ වුවද දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම රු.550,000,000 ක් හා රැස් කරන ලද ආදායම රු.286,772,138 ක් වීම හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස් කරන ලද ආදායම රු. 263,227,862 ක් එනම් සියයට 48 ක් අඩු වී තිබුණි. | ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කරන අවස්ථාව වන විට රට තුළ ව්‍යාප්ත වූ COVID 19 වසංගත තත්ත්වය ක්‍රමයෙන් සමනය වෙමින් 2020 ජූනි, ජූලි, අගෝස්තු හා සැප්තැම්බර් මාස වල උද්භිද උද්‍යාන ආදායමේ ක්‍රමානුකූල ඉහළ ගිය බවත් ඒ අනුව දෙසැම්බර් මාසය වන විට ක්‍රමානුකූල වර්ධනයක් සිදුවෙතැයි පුරෝකථනය කර අදායම සංශෝධනය කළ නමුත් COVID 19 දෙවන රැල්ල 2020 ඔක්තෝබර් මාසයේ නැවත ඇතිවීම හේතුවෙන් අපේක්ෂිත අදායම රැස් කර ගැනීමට නොහැකි වූ බව. | මුදල් රෙගුලාසි 85(1) ආ හා 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුගමනය කර ආදායම් වඩාත් කාර්යක්ෂමව පුරෝකථනය කළ යුතු වීම. |

## 2.3 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ මූලධන වියදම් සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු.183,962,000 ක් වූ අතර ඉන් උපයෝජනය කර තිබුණේ රු. 128,268,255 ක් පමණි. ඒ අනුව මූලධන වියදම්වලින් රු. 55,693,745 ක් එනම් සියයට 30 ක් ඉතිරිවී තිබුණි. | ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කර අවසන් කර තිබුණු නමුත් 2020 දෙසැම්බර් අග්‍රිම ඉල්ලුම් පත්‍රය මගින් මූලධන ව්‍යාපෘති සඳහා ඉල්ලුම් කරන ලද රු.මි. 121 ක අග්‍රිමය සම්පූර්ණයෙන් නොලැබීම නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බවත්, එය මුල්‍ය ප්‍රකාශනයේ බැදීම් හා බැරකම් යටතේ වාර්තා කර ඇති බවත්, වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුව ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණු නමුත් ආනයන සීමා පැවතීම නිසා භාණ්ඩ නොලැබීම හා රට තුළ පැවති COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් දෛනික කටයුතු වල පැවති විවිධ සංකීර්ණතා නිසා ලංසු නොලැබීම මත අත්හැර දැමීමට සිදු වූ බව. | ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. |

## 2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී වැය විෂයයන් දෙකක ඉතිරිවීම් ඉක්මවා රු. 3,478,830 ක බැරකම්වලට එළඹ තිබුණි. | විගණනයෙන් පෙන්වාදෙන කරුණ පිළිගන්නා අතර මෙවැනි අඩුපාඩු ඉදිරියේදී සිදු නොවීමට කටයුතු කරන මෙන් අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම් ඇතිකර නොගත යුතු වීම. |
| (ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2021 වර්ෂයේදී කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂණය අනුව අවස්ථා 13 කදී ගෙවා තිබූ එකතුව රු.1,056,682 ක වියදම් 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 6 ප්‍රකාරව බැරකම් ලෙස දක්වා නොතිබුණි. | විගණනයෙන් පෙන්වාදෙන කරුණ පිළිගන්නා අතර බැරකම් ලේඛනය නිවැරදි කර ඉදිරිපත් කරන බව. | සියලුම බැරකම් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වීම. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 643 | සීතාවක උද්භිද උද්‍යානයේ ගබඩාවේ පැවති කාලානුරූප නොවන විදේශීය ප්‍රවේශ පත්‍ර 6947 ක තොගයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉතිරිව ඇති විදේශීය ප්‍රවේශපත්‍ර නීත්‍යානුකූලව අපහරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | කාලානුරූප නොවන ආකෘති පත්‍ර මුදල් රෙගුලාසිවල විධිවිධාන ප්‍රකාරව විධිමත්ව අපහරණය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිසම් සභාව විසින් 2009 පෙබරවාරි 20 වැනි සිකුරාදා දින නිකුත් කරන ලද අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්යය පරිපාටික රීති 1 කාණ්ඩයේ XVIII වන පරිච්ඡේදයේ 193 වන වගන්තිය | ගම්පහ උද්භිද උද්‍යානයේ නිලධාරීන් 6 දෙනෙකු වසර 9 ත් වසර 20 අතර කාලයක් එකම සේවා ස්ථානයේ සේවය කර තිබුණි. | දෙපාර්තමේන්තුගත තනතුරුවල ස්ථාන මාරු ප්‍රතිපත්තියක් නොමැති බවත් පදිංචි ස්ථානයට ආසන්න සේවා ස්ථානයක් ලබා දීමෙන් තෘප්තිමත් නිලධාරීන් තුළින් වඩාත් ඵලදායී සේවාවක් ලබා ගත හැකි බව. | කාර්යය පරිපාටික රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්‍රාම ගිය, මියගිය, සේවය හැරගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 12 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.673,250 ක් වූ ණය ශේෂ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය අනුව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම හිඟ ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | හිඟ හිටි අත්තිකාරම් ණය ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |

**2.7 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තැන්පත් කර වසර 02 ක් ඉක්මවූ එකතුව රු. 5,013,965 ක් වූ තැන්පතු ශේෂ 30 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඇතැම් තැන්පතු සම්බන්ධයෙන් අදාළ අයතනය දැනුවත් කර ඇති අතර ඇතැම් තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 පරිදි අදාළ වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම, ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වලින් අපේක්ෂිත නිමැවුම/ ප්‍රතිඵල ඇතුළත් වන පරිදි ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වීම. |

**3.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ඉකුත් වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට හග්ගල උද්භිද උද්‍යානයේ LED පුවරු සවි කිරීමේ කාර්යය ඇතුළත් කර නොතිබුණි. 2019 වර්ෂයේ වැය ශීර්ෂ 6000-0-0-6-70 යටතේ වූ රු.6,481,080 ක ප්‍රතිපාදන මේ සඳහා භාවිතා කර තිබුණි. ජාතික උද්භිද උද්‍යානයේ සංවර්ධන සැලැස්ම සඳහා හඳුනාගත් මූලික කාර්යයන් තුළ ශාක සංරක්ෂණය ඇතුළු කාර්යයන් බහුතරයක් තවදුරටත් සම්පූර්ණ කර නොතිබියදී ප්‍රමුඛතාවය පිළිබඳ අවධානයකින් තොරව මෙම ප්‍රසම්පාදන කාර්යය ඉටු කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | ක්‍රියාකාරකම් වෙනස් කිරීමේදී ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ මල් වගා පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් නිෂ්පාදිත පැළ සහ ආසාදිත පැළ පිළිබඳ පරීක්ෂාවේදී 2019 ජනවාරි සිට 2020 අගෝස්තු දක්වා කාල පරාසය තුළ නිෂ්පාදිත පැළ සංඛ්‍යාව 10460 ක් හා ආසාදිත පැළ සංඛ්‍යාව 4987 ක් විය. එය ප්‍රතිශතයක් ලෙස සියයට 48 ක් විය. | මේ සඳහා යොමුකළ නිලධාරීන්ගේ අඩු ප්‍රවීනතාවය මෙයට හේතු වී ඇති බවත් දැනටමත් ඒ සඳහා උපදෙස් ලබා දී ඇති බව. | නිෂ්පාදනය කරනු ලබන පැළවල ගුණාත්මකභාවය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |
| (ආ) | රාජකීය උද්භිද උද්‍යානයේ ගබඩා ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ අයිතම 152 කින් අයිතම 85 ක වටිනාකම රු. 3,046,321 ක් එනම් සියයට 16.54 ප්‍රතිශතයකට අදාළ වැඩ ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩුවෙන් ඉටු කර තිබුණි . ඒ තුළ අයිතම 28 කට අදාළ වටිනාකම රු. 1,256,822 ක් වූ කාර්යයන් සම්පූර්ණයෙන්ම ඉටු කර නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුවේ කාර්යයන් ඉටුකිරීමේදී ඇතිවූ වෙනස්කම් හේතුවෙන් මෙම අතිරේක කාර්යයන් ඉටු කිරීමට සිදුවී ඇති බව | ඇස්තමේන්තුගත කාර්යයන් නිවැරදිව ඉටු කරවා ගත යුතු වීම |
| (ඇ) | රාජකීය උද්භිද උද්‍යානයේ ගබඩා ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ ප්‍රමාණ බිල් පත් හා මැනුම්පත්වල සඳහන් අයිතම අංක 63 සහ 122 ප්‍රකාරව බිම් මහළ හා ඉහළ මහලේ බිම සිමෙන්ති යෙදීම වෙනුවෙන් පිළිවෙළින් වර්ගමීටර් 222.98 ක් හා 239.41 ක් වෙනුවෙන් රු. 674,221 ක් නිර්දේශ මත ගෙවීම් සිදුකර තිබුණද 2020 සැප්තැම්බර් 20 දින භෞතික විගණන පරීක්ෂාව අනුව බිම් මහල හා ඉහළ මහලෙහි සිමෙන්ති යොදන ලද බිම බොල් වී තිබුණි. | එම අඩුපාඩුව නැවත සකසනමෙන් 2021 මාර්තු 15 දින ලිපියක් මගින් කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇති බව. | -එම- |
| (ඈ) | රාජකීය උද්භිද උද්‍යානයේ ගබඩා ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ අයිතම 144 හා එහි චිත්‍ර සැලසුම ( Drawing ) ප්‍රකාරව ඒකකයක් අඩි 40 ක දිගින් යුක්ත වන යකඩයෙන් නිම කරන ලද බාල්ක (Truss) අඩි 2 න් 2 කට වන ලෙස එම බාල්ක (Truss) 04 කැලි 140 ක් ඇතුළත් වන ලෙස නිමකළ යුතු වුවද, කැලි 88 පමණක් ඇතුළත්වන ලෙස කැලි 52 ක් අඩුවෙන් හා චිත්‍ර සැලසුම් (Drawing) ප්‍රකාරව නිම කර නොතිබුණි. | කැබලි 88 ක් යොදවා ඇති බවත් අඩුවෙන් යෙදූ කැබලි 52 වෙනුවෙන් රු. 62,882 ක මුදලක් කොන්ත්‍රාත්කරුගෙන් අයකරගෙන ඇති බව. | ඇස්තමේන්තු හා චිත්‍ර සැලැසුම් අනුව කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු බව. |

**3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ 2016 අගෝස්තු 04 දින රු.6,677,573 ක කොන්ත්‍රාත් වටිනාකමට ආපනශාලාවක් ඉදිකිරීම සඳහා ගිවිසගෙන තිබූ ව්‍යාපෘතිය 2016 දෙසැම්බර් 21 දින නිමකර උද්‍යානයට බාරදී තිබුණි. නමුත් එදින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා වසර 04 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, එම ඉදිකරන ලද ගොඩනැගිල්ල අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදවා ගෙන නොතිබුණි. | අපේක්ෂිත තරම් නරඹන්නන් නොමැතිවීම හේතුවෙන් ආපන ශාලාව පවත්වාගෙන යාමට ලංසුකරුවන් කිසිවෙකු ඉදිරිපත් නොවූ බවත් මෙය තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස යොදා ගැනීමට තීරණය කර ඇති බව. | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ රු.26,567,937 ක කොන්ත්‍රාත් වටිනාකමකට පර්යේෂණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ගිවිසගෙන තිබූ අතර, මෙම පර්යේෂණ මධ්‍යස්ථානය 2019 නොවැම්බර් 26 දින නිමකර භාර දී තිබුණි. නමුත් 2020 දෙසැම්බර් 31 දින වන තෙක් එම ඉදිකිරීම් අපේක්ෂිත අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා උපයෝජනය කර නොතිබුණි. | පර්යේෂණ මධ්‍යස්ථානය ආරම්භ කිරීමට අවශ්‍ය කාර්යාල උපකරණ ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන 2020 වර්ෂයේ තුන්වන කාර්තුවේදී ලැබීම මෙයට හේතු වී ඇති බව. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට අදාළ වත්කම් භාවිතා කළ යුතු වීම |
| (ඇ) | ගම්පහ උද්භිද උද්‍යානයේ නරඹන්නන්ගේ ආශ්වාදය වැඩි කිරීමේ අරමුණෙන් රුපියල් මිලියන 23.76 ක පිරිවැයක් දරා 2017 වර්ෂයේ උඩවැඩියා (ඕකිඩ්) ගෘහයක් ඉදි කර තිබුණි. මෙම ගෘහයේ පිහිටීම, එහි ආකෘතිය හා සවිකර ඇති වීදුරු දුර්වර්ණ වී පැවතීමත් හේතුවෙන් උඩවැඩියා මල් පිපීම සඳහා අත්‍යාවශ්‍ය අංගයක් වන උදෑසන පැහැදිලි හිරු එළිය ලැබීමේ අඩු ප්‍රවණතාවයක් පැවතීම මත උඩවැඩියා මල් හට ගැනීම සිදු වී නොතිබුණි. මේ හේතුවෙන් ඉදිකර ඇති මෙම ගෘහයෙන් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි. | දැනට සාදා නිම කර ඇති ආකෘතිය වෙනස් කිරීමට නොහැකි අතර ගෘහයට ලැබෙන උදෑසන හිරු එළිය වැඩි කිරීමට අවට ඇති ශාකවල අතු ඉවත් කර ඇති බවත් ගෘහයේ වීදුරු සතිපතා පිරිසිදු කිරීම කරනු ලබන බව. | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා ඕකිඩ් ගෘහය විචිත්‍රවත් ආකාරයට පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානයේ 2017 වර්ෂයේදී රු. 3,955,092 ක මුදලක් වැය කර ගබඩාවක් හා එයට යාබද රජයේ නිවාසය ඉදි කර තිබුණද එය ඉදිකළ වර්ෂයේ සිට අවුරුදු 03 කට වැඩි කාලයක් සේවකයන්ගේ සුහසාධන කටයුතු සඳහා භාවිතා කර තිබුණද අපේක්ෂිත අරමුණු සඳහා යොදවා නොතිබුණි. | මෙය භාවිතයට දීමට සුදුසු නිලධාරියෙකු නොමැති බැවින් මේ දක්වා එය පදිංචියට ලබා දී නැති බව. | අපේක්ෂිත අරමුණු සඳහා යොදවා ගතයුතු වීම |

**3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිරිජ්ජවිල, වියළි කලාපීය උද්‍යානයේ කාන්තාර ආකෘතියක් නිර්මාණය කිරීමේ අරමුණින් 2018 දෙසැම්බර් 12 වන දින මිලදී ගන්නා ලද රු. 770,000 ක් වටිනා වැලි කියුබ් 110 න් 2020 සැප්තැම්බර් 04 දින වන විට රු. 266,000 ක් වටිනා වැලි කියුබ් 38 ක් අවුරුදු 01 මාස 08 ක් අපේක්ෂිත අරමුණු වෙනුවෙන් භාවිතයට නොගෙන උද්‍යාන පරිශ්‍රයෙහි තිබුණි. තවද මේ සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීම සඳහා තාක්ෂණික නිලධාරියෙකු උද්‍යානයේ නොමැති බවත් කාන්තාර ආකෘතිය නිර්මාණය කිරීම සඳහා විශේෂඥ දැනුම අවශ්‍ය බවත් ඉතිරිව තිබූ සියලු මුහුදු වැලි යොදාගෙන කාන්තාර ආකෘතිය නිර්මාණය කිරීම අවසන් කර ඇති බව. | අදාළ කාර්යයන් නියමිත කාලය තුළ නිම කළ යුතු වීම. |
| (ආ) | සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ ව්‍යාපෘතිය 2019 අප්‍රේල් 22 වන දින සිට මාස 08 ක් ඇතුළත එනම් 2019 දෙසැම්බර් 24 දින හෝ ඊට පෙර ඉටු කළ යුතුව තිබුණද , එම නියමිත දිනට වඩා දින 239 කට පසු මෙම ව්‍යාපෘතිය නිම කර භාර දී තිබුණි. | අදහස් දක්වා නොමැත. | අදාළ කාර්යයන් නියමිත කාලය තුළ නිම කළ යුතු වීම. |

**3.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ කාර්යාල ගොඩනැගිල්ල රු 25,682,196 (වැට් රහිත) කොන්ත්‍රාත් වටිනාකමකට ඉදිකිරීම් කටයුතු ආරම්භ කර 2020 අගෝස්තු 20 දින අවසන් කර භාර දී තිබුණද 2021 පෙබරවාරි 03 වන දින වන විටත් අදාළ ගොඩනැගිල්ලට විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් භාවිතයට නොගෙන පැවතුණි. මෙලෙස අදාළ ගොඩනැගිල්ල සහ විදුලි උපකරණ භාවිතයට නොගෙන තිබීම හේතුවෙන් ප්‍රයෝජනයට නොගෙනම එහි අඩුපාඩු පිළිබඳ වගකීම් කාලය (Defeets Liability Period) විදුලි උපකරණයන්ගේ වගකීම් කාලයද අවසන් වන නිසා කෙටි කාලයක් තුළ යම් අළුත්වැඩියාවක් හෝ නව උපකරණයක් හුවමාරු කර ගැනීමට ඇති අවස්ථාව ආයතනයට අහිමි වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | දෙපාර්තමේන්තුව සතු වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3.7 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව වැඩ විෂයන් 06 කට වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනයම එනම් රු.6,500,000 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් නිවැරදිව ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් වැය විෂයන් 13 ක ප්‍රතිපාදනවල ඉතිරිවීම් සියයට 14 සිට සියයට 95 දක්වා පරාසයක පැවතුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පහළ මට්ටමක පැවතුනි. | අදහස් දක්වා නොමැත. | ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කාර්යයන් නියමිත කාලය තුළ නිම කළ යුතු වීම. |

**3.8** **ප්‍රසම්පාදනයන්**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 ඡේදයේ නියාමනයන්ගෙන් බැහැරව මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයේ ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ සිදු කරන ලද එකතුව රු. 3,778,462 ක් වූ ප්‍රසම්පාදන මිල කැඳවීම් අවස්ථා 20 කට අදාළව ලංසු විවෘත කිරීමේ දී දින 01 සිට දින 10 දක්වා කාල ප්‍රමාදයන් සිදු කර තිබුණි. | කමිටුවේ සභාපතිට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීවරයාට ලංසු විවෘත කිරීමේ කාර්යය සඳහා පවතින රාජකාරී හේතුවෙන් නියමිත දිනයන්ට සහභාගී වීමට නොහැකි බවත් ඒ හේතුවෙන් ලංසු විවෘත කරන දින වෙනස් වීමට හේතු වන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ලංසු විවෘත කිරීම් කළ යුතු වීම. |
| (ආ) | සිදු කරන ලද නියැදි පරීක්ෂණය අනුව දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත් 4 කට අදාළව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) හා (ආ) මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි. | මින් ඉදිරියට ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ප්‍රසම්පාදන කාල සටහන් සකස් කළ යුතු වීම. |
| (ඇ) | සිදු කරන ලද නියැදි පරීක්ෂණය අනුව දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත් 4 කට අදාළව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 මාර්ගෝපදේශය අනුව දෙපාර්තමේන්තු තාක්ෂණික ඇගැයීම් කමිටු පත් කිරීම සඳහා ඉල්ලීම ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම සඳහා කර ඇති ඉල්ලීමට සමගාමීව සිදු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සිදුකළ යුතු බවත්, ඒ අනුව අප දෙපාර්තමේන්තුව කටයුතු කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සිදු කරන ලද නියැදි පරීක්ෂණය අනුව දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත් 4 කට අදාළව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) මඟින් ඉදිරිපත් කර ඇති ප්‍රමිති ලංසු ලේඛන ප්‍රසම්පාදන කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. | 2020 වසරේ සිට සුළු පරිමාණ ප්‍රසම්පාදන කටයුතු සඳහා ඉදිකිරීම් සංවර්ධන අධිකාරිය **(CIDA)** විසින් නිකුත් කරන ලද ලංසු ලේඛන භාවිතා කිරීමට කටයුතු කරන ලද බව. | ප්‍රමිති ලංසු ලේඛන ප්‍රසම්පාදන කටයුතු සඳහා භාවිතා කළ යුතු වීම. |
| (ඉ) | සිදු කරන ලද නියැදි පරීක්ෂණය අනුව දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත් 4 කට අදාළව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:12:2 මාර්ගෝපදේශය අනුව වැඩ අවසන් කිරීමේ සහතිකයක් නිකුත් කර නොතිබුණි. | ගෙවීම් වවුචරයේ 8:12:2 නිර්දේශ සිවිල් ඉංජිනේරුවරයා විසින් ලබා දී ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | රාජකීය උද්භිද උද්‍යානයේ කිරිහලේ වහලය අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුවේ අයිතම අංක 06 හි ඇස්තමේන්තුගත වටිනාකම රු. 911,400 ක් වූ අතර එය සඳහා රු.492,000 ක් ලංසුවේ සඳහන් කර තිබීම හේතුවෙන් තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් ලංසු ඇගැයීමේදී එය සැලකිල්ලට ගෙන නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වුවද මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් රු. 320,056 ක් අමතර වැඩ ඉටු කර තිබූ අතර රු. 494,167 වැඩ ඉටුකර නොතිබුණි. එය ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමින් ප්‍රතිශතයක් ලෙස සියයට 21 ක් හා සියයට 33 ක් විය. අයිතම අංක 03 ලුනුම්දැල්ල දැව යෙදීම සඳහා වර්ග මීටර් 30.71 ක් වෙනුවෙන් රු.61,020 ක් වැඩියෙන් ඇස්තමේන්තු කිරීම, මීටර් 85.57 ක් වූ කුඹුක් දැව ලෑලි 45 ක් ඉරිතැලී තිබීම **,** දිරාපත්වීම **,** මුට්ටු **(joint)** ලෙස සම්බන්ධ කිරීම**,** ලෑලි ඇඹරී පැවතීම යන කරුණු මත සුදුසු ප්‍රමිතියෙන් යුතු දැව යොදා නිම කර නොතිබුණි. ඒ සඳහා රු.140,531 ක් ගෙවා තිබුණි. මෙම ඉදිකිරීමේ අඩුපාඩු නිවැරදි කරන තෙක් රඳවුම් මුදල් නිදහස් කළ නොහැකි බව දන්වා මාස 07 කට අධික කාලයක් ගතවී පැවතුණද එම අඩුපාඩු 2020 දෙසැම්බර් 31 දින වන විටද නිවැරදි කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු ගෙන්වා සාකච්ඡා කළ අතර අදාළ කුඹුක් ලෑලි තොගයක් ඔහු සතුව ඇති බැවින් එම වටිනාකමට මෙම ප්‍රසම්පාදන කාර්ය ඉටු කිරීමටත් එම ප්‍රකාශය ලිඛිතව ලබාදීමට කොන්ත්‍රාත්කරු එකඟ වුවද අතපසුවීමකින් එම ලිඛිත ප්‍රකාශය ලබාගැනීමට නොහැකි වී ඇති බවත් ඉදි කිරීමේ අවස්ථාවේදී හොඳ තත්වයෙන් පැවති ද්‍රව්‍ය නැවත භාවිතා කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතුරු වී ඇති බවත් මෙම කොටස නිමකර අවුරුද්දක් පමණ ගත වී ඇති බැවින් සහ හිරු එළිය කෙලින්ම පතිත වන බැවින්ද මෙම ලෑලි වල ඝණකමින් යම් කිසි කොටසක් අඩු වී ඇති බවත් ඇඹරී ඇති ලෑලි හා දිරාපත් කොටස ඉවත් කර නැවත ලෑලි සපයා සවි කරන ලෙස ලිඛිතව මෙම කොන්ත්‍රාත්කරුට තුන්වරක් දැනුම් දී ඇති බව. | i.රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම<br>ii. ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීම<br>iii. ඇස්තමේන්තුව අනුව කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (උ) | රාජකීය උද්භිද උද්‍යානයේ ගබඩා ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ අයිතම 152 න් අයිතම 37 කම ප්‍රමාණ වැටයීම සියයට 7.12 සිට සියයට 1800 දක්වා පරාසයක පැවතුණි. අමතර වැඩ අයිතම 29 ක් ඉටු කර තිබූ අතර එහි කොන්ත්‍රාත් වටිනාකම රු. 2,039,943 ක් විය. ඒ අනුව මෙම කොන්ත්‍රාත් කාර්යයට අදාළ විචලනයේ වටිනාකම රු. 4,234,653 ක් වීම සහ එය මුළු ඇස්තමේන්තගත වටිනාකමින් ප්‍රතිශතයක් ලෙස සියයට 23 ක් වීමෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශයට අනුකුල නොවන පරිදි ක්‍රියා කර තිබුණි. | මෙම කොන්ත්‍රාත්තුවේ කාර්යයන් ඉටුකිරීමේදී ඇතිවූ වෙනස්කම් හේතුවෙන් මෙම විචලනය සිදුවී ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඌ) | රාජකීය උද්භිද උද්‍යානයේ ගබඩා ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුවේ අයිතම අංක 144 ප්‍රකාරව දෙවන මහලේ වහලය යකඩ මගින් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණි. ඒ සඳහා ඒකකයක් රු. 215,600 බැගින් යකඩයෙන් නිම කරන ලද බාල්ක (Truss) 04 ක ඇස්තමේන්තුගත පිරිවැය රු. 862,400 ක් වුවද තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරු විසින් ඒකකයක් රු. 100,000 බැගින් ඒකක 04 සඳහා රු. 400,000 කට ඉදිකිරීම සඳහා ගිවිසගෙන තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත වටිනාකමට වඩා රු. 462,400 ක් එනම් සියයට 53.6 ක් අඩුවෙන් ලංසුව ඉදිරිපත් කර තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මේ පිළිබඳව කොන්ත්‍රාත්කරුගෙන් විමසීමේදී තම ආයතනය සතුව එකී පිරිවිතර ප්‍රකාරව යකඩ බාල්ක අතිරික්තයක් පවතින බැවින් එම වටිනාකම ඉදිරිපත් කර ඇති බව සඳහන් කර ඇති බවත් එය ලිඛිතව ලබාදෙන ලෙස දන්වා ඇතත් අතපසුවීමකින් අදාළ ලිපිය ලබා ගැනීමට නොහැකි වී ඇති බව. | විධිමත් පරිදි ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම |
| (එ) | සීතාවක තෙත් කලාපිය උද්භිද උද්‍යානයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කොන්ත්‍රාත් කාර්යය විචලනයේ මුළු වටිනාකම රු.5,891,292 ක් වීම සහ එය මුළු ඇස්තමේන්තගත වටිනාකමින් ප්‍රතිශතයක් ලෙස සියයට 19.6 ක් වීමෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශයට අනුකුල නොවන පරිදි ක්‍රියා කර තිබුණි. තවද මෙම ව්‍යාපාතිය පිළිබඳ සළකා බැලීමේදී විචලනය සියයට 15 ක් වුවද මේ සම්බන්ධව ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ පූර්ව අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. මෙම ගොඩනැගිල්ලේ යකඩ ග්‍රිල් මළ බැඳීමට ලක් වී තිබුණද වරග මීටර් 157.32 ක් සඳහා රු 1,681,110 ක් ගෙවා තිබුණි. ගොඩනැගිල්ලෙහි ඇතුළත | අදහස් දක්වා නොමැත | ඇස්තමේන්තු වඩාත් නිවැරදිව පිළියෙල කළ යුතු අතර ඇස්තමේන්තුගත කාර්ය නිවැරදිව ඉටුකරවා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | Homogeneous glazed polished floor tile ඇතිරීම සිදු කළ යුතු වුවද Homogeneous floor tile යොදා තිබූ අතර ඒ අනුව රු.267,063 ක් වැඩිපුර කොන්ත්‍රාත්කරුවෙත ගෙවා තිබුණි. තවද Skirting සඳහා ද glazed polished floor tile සඳහා ගෙවන රේටය යොදා ගනිමින් රු176,822 ක් ගෙවා තිබුණි. කාර්යාල ගොඩනැගිල්ලෙහි පඩිපෙලට අත් වැටක් ඉදි කිරීම රු.186,560 ක මුදලක් ගෙවා තිබුණද. අත් වැටෙහි සිරස් අතට යොදන ලද 1" ක විෂ්කම්භයකින් යුතු වානේ බට අතර පරතරය ප්‍රමාණ පත්‍රයෙහි දක්වා ඇති අවශ්‍යතාවයට අනුකූල නොවන ලෙස ඉදිකර තිබූ අතර අත්වැට මල බැඳී තිබුණි. | | |
| (ඒ) | හග්ගල උද්භිත උද්‍යානයේ LED පුවරුවක් සකස් කර සවිකිරීම වෙනුවෙන් මිල ගණන් කැඳවා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 (ඇ) මාර්ගෝපදේශයෙන් බැහැරව LED පුවරු 02 ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. තාක්ෂණික ඇගැයීම් කමිටුව මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 මාර්ගෝපදේශයෙන් බැහැරව සියලුම සනාථ කිරීමේ ලේඛන සහිතව ඇගැයීම හා සනාථ කර ගැනීමකින් තොරව නිර්දේශ ලබාදී තිබුණි. මේ සඳහා 4.3 මාර්ගෝපදේශයට අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. 8.9.1(ආ) මාර්ගෝපදේශය අනුව කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. 3.8 මාර්ගෝපදේශය අනුව සියයට 10 කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. මෙම LED පුවරුව ක්‍රියාත්මක කර භාවිතයට සුදුසු බව තහවුරු කිරීමකින් තොරව හා තාක්ෂණික ඇගැයීම් කමිටුවේ නිර්දේශ ලබාගැනීමකින් තොරව 2019 දෙසැම්බර් 31 දින මේ සඳහා රු.6,481,080 ක් ගෙවීම් කර තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටද තෙකලා විදුලිය ලබා නොගැනීම හේතුවෙන් ප්‍රයෝජනයට ගත නොහැකිව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | හග්ගල උද්භිද උද්‍යානයේ වැසිකිලි පද්ධතිය ඉදිකිරීම සඳහා රු.2,704,097 ක ඇස්තමේන්තුවක් තුළ ඇලුමිනියම් දොරවල් සපයා සවිකිරීමට වර්ග මීටර් 29.6 ක් සඳහා රු.297,213 ක් ගෙවීම් කර තිබුණි. ඇස්තමේන්තු සකස් කිරීමේදී ඇලුමිනියම් තහඩුවල ඝනත්වය හා ප්‍රමිතිය පිළිබඳව සඳහන් නොකිරීම හේතුවෙන් එම දොරවල් සවි ශක්තියෙන් අඩු බවත්, නැවත එම දොරවල් සකස් කළ යුතු බවත් විගණනයට තහවුරු විය. | අදහස් දක්වා නොමැත. | පිරිවිතර වඩාත් නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතු වීම |

**3.9 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | ------------------------------------ | ----------- |
| (අ) | මීගලෑව හරිත පියස හා පුහුණු මධ්‍යස්ථානයට විසුරුම් ජල පද්ධතියක් සැකසීම සඳහා 2018 වර්ෂයේදී රු. 625,373 ක වියදමක් දරා අවශ්‍ය උපකරණ මිලදී ගෙන ආසන්න වශයෙන් හෙක්ටයාර 1 ක පමණ ප්‍රමාණයක විසුරුම් ජල සම්පාදන පද්ධතිය සවිකර තිබුණද උද්‍යානයේ පැවති පැරණි ළිඳේ ජල ධාරිතාවය ප්‍රමාණවත් නොවීම මත විසුරුම් ජල පද්ධතිය ක්‍රියාත්මක කළ නොහැකිව ඌන උපයෝජිතව පැවති බවත් මිලදීගෙන තිබූ උපකරණවලින් රු. 48,505 ක් වටිනා අඟල් 2 පී.වී.සී. බට 109 ක් හා රු. 144,270 ක් වටිනා අඟල් 1 පී.වී.සී. බට 630 ක් 2020 දෙසැම්බර් 17 දින වන විටත් වසර 2 කට වැඩි කාලයක් ගබඩාවේ ඌන උපයෝජිතව පැවතුණි. | 2019 වර්ෂයේ මැද භාගය වන විට කොටස් වශයෙන් දැනට පවතින විසිරුම් ජල සම්පාදන පද්ධතිය සකසා ඇති බව හා ඒ වන විට ශුෂ්ක කාලගුණයක් පැවති අතර පොළවෙහි කාණු කැපීම අපහසු බැවින් ජල සම්පාදන පද්ධතියෙහි ඉතිරි කොටස්වලට පසුව යෙදීමට තීරණය කරන ලද බවත් 2020 වර්ෂයේ COVID 19 හේතුවෙන් මාස කිහිපයක් කම්කරුවන් නොපැමිණීම සහ වගා ළිඳ සකසා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඉතිරි කොටස නිම කිරීමට නොහැකි වූ බව. | මිලදීගත් වත්කම් අපේක්ෂිත කාර්යය වෙනුවෙන් යෙදවීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානයේ රු. 8,118,525 ක් වැය කර ඉදිකර තිබූ නේවාසිකාගාරය 2018 වර්ෂයේ නේවාසික පුහුණු වැඩසටහන් 02 ක් සඳහා භාවිතා කර තිබුණද 2019 හා 2020 වර්ෂයේ කිසිදු නේවාසික පාඨමාලාවක් සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | 2019 වසරේ හා 2020 වසර වලදී පිළිවෙලින් පාස්කු බෝම්බ පිපිරීම හා කොරෝනා තත්වය යටතේ රටේ ඇති වූ වාතාවරණය මත පුහුණු පැවැත්වීමට නොහැකි වූ බව. | දෙපාර්තමේන්තුව සතු වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයට අයත් ඉඩමෙහි අක්කර ½ ක පමණ කුඹුරු ඉඩම අනවසර පදිංචිකරුවෙකු විසින් භුක්ති විදින අතර, මේ පිළිබඳව සීතාවක ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර තිබුණද ඒ සඳහා 2021 පෙබරවාරි 3 දින වන විටත් විසඳුමක් ලැබී නොතිබුණි. | මෙම අනවසර පදිංචිකරු ඉවත් කර ඉඩම් නිරවුල් කර දීමට නීතිපති විසින් ද සීතාවක ප්‍රාදේශීය ලේකම්ට උපදෙස් ලබා දුන් බවත් ඒ සඳහා පිළිතුරු යොමු කල බවත් 2019 අගෝස්තු 01 දින සීතාවක ප්‍රාදේශීය ලේකම්ගේ අත්සනින් යුතුව මෙම දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව. | දෙපාර්තමේන්තුව භුක්ති විදින සියලුම ඉඩම් නිරවුල් කර අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | දෙපාර්තමේන්තුව සතුව වසර 2 වැඩි කාලයක සිට ගර්හිත තත්ත්වයේ පවතින රථවාහන 5 ක් අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | වාහන අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | හම්බන්තොට වියළි කලාපීය උද්භිද උද්‍යානය වෙළඳසැල්, පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කෞතුකාගාරය සහ මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානයේ නේවාසිකාගාරයට අදාළ වර්ග අඩි 20250 ක ප්‍රමාණයක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඌන උපයෝජිතව පැවතුණි. | අදහස් දක්වා නොමැත | දෙපාර්තමේන්තුව සතු වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. |
| (ඊ) | අවශ්‍යතාවය නිවැරදිව නිශ්චය කිරීමකින් තොරව මිලදීගත් අමුද්‍රව්‍ය තොගවලින් රු.1,060,120 ක තොගයක් 2020 නොවැම්බර් 13 දින වන විට හක්ගල උද්භිද උද්‍යානයේ ගබඩාවේ ඉතිරි වී තිබුණි. | අදහස් දක්වා නොමැත | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන මිලදී ගැනීම් සිදුකළ යුතු වීම. |
| (උ) | පේරාදෙණිය උද්භිද උද්‍යානයේ යන්ත්‍රානුසාරයෙන් කුණු රොඩු පිසදා එකතු කිරීම සඳහා පදවාගෙන යා හැකි යන්ත්‍රයක් රු.2,242,500 කට මිලදීගෙන තිබුණි. සමතලා නොවන භූමියක කුණුරොඩු අතුගා ඒකතු කිරීම කළ නොහැකි වීම හේතුවෙන් මෙම යන්ත්‍රය වගකීම් කාලය තුළදීම අක්‍රීය වී තිබුණි. | අදහස් දක්වා නොමැත | අදාළ යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් ලබාගැනීමට හෝ එය වගකීම් කාලය තුළ අළුත්වැඩියා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.10 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව මිරිජ්ජවිල හා ගම්පහ උද්භිද උද්‍යානවලට අනුයුක්තව සේවය කරනු ලබන සේවකයින් 32 දෙනෙකුගෙන් ඇප තැන්පතු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප අයකළ යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පතු ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට එක් එක් උද්‍යාන දැනුවත් කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3.11 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 04 ක් සඳහා 2021 මැයි 31 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි. | අදහස් දක්වා නොමැත | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය හා මුදල් රෙගුලාසි 155 අනුව විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමට කටයුතු කළ යුතු වීම. |

## 3.12 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මිරිජ්ජවිල උද්භිද උද්‍යානය සතුව පවතින ගොල්ෆ් කාර් 10 න් 03 ක් වසරකට ආසන්න කාලයක් කාර්මික දෝෂ හේතුවෙන් ධාවනයෙන් ඉවත් කර තිබුණි. තවද 2018 ජුනි සිට 2020 පෙරවාරි දක්වා වූ කාල පරාසය තුළ දෛනිකව සේවා කාලය පැය 08 ක් ලෙස සැලකූවිට පැය 41376 ක් වූ වැඩකල හැකි පැය ගණනින් පැය 33891 ක් ගොල්ෆ් රථ ධාවනය සඳහා යොදාගෙන නොතිබුණි. | රටේ පවතින කොරෝනා වසන්ගත තත්ත්වය හේතුවෙන් නරඹන්නන් විශාල වශයෙන් අඩුවීම හේතුවෙන් ගෝල්ෆ් කාර් ඉල්ලුම අඩු වූ බව. | අවශ්‍යතාවයන් නිසිපරිදි හඳුනාගෙන මිලදී ගැනීම් සිදුකිරීම හා වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
| --- | --- | --- | --- |
| (ආ) | මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ දක්ෂිණ දොරටුවේ සිට ට්‍රොපියර් උද්‍යානය දක්වා ආරුක්කු සැකසීම සඳහා 2019 දෙසැම්බර් රු. 273,000 කට මිලදී ගන්නා ලද GI බට 39 ක් එම කාර්යයට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය පිලිගනිමි. ආයතන සංග්‍රහය ප්‍රකාරව අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව. | -එම- |
| (ඇ) | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව ගම්පහ උද්භිද උද්‍යානය විසින් සිදුකර තිබූ මිලදී ගැනීම් හේතුවෙන් වටිනාකම රු. 437,259 ක් වූ තොග අයිතම 05 ක් විගණිත දිනය වූ 2020 සැප්තැම්බර් 30 දින වන විට වසර 02 කට වඩා වැඩි කාලයක් ගබඩාවේ පවතින අතර ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම මත මල් පෝච්චි 18,295 ක් එළිමහන් කොටසක අක්‍රමවත් ලෙස ගොඩ ගසා තිබුණි. | තීන්ත අලේප කිරීම 2021 පලමු කාර්තුව අවසන් වීමට පෙර නිම කිරීමටත්, මල් පෝච්චි තවානේ කටයුතු සඳහා යොදා ගැනීමටත් හා අනෙකුත් තීන්ත ආයතනයේ කටයුතු සඳහා භාවිතා කිරීමටත් උපදෙස් ලබා දී ඇති බව. | අවශ්‍යතාවයන් නිසිපරිදි හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම. |
| (ඈ) | සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයට අයත් ආපනශාලාව රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකර සුභසාධක සංගමය වෙත රු.15,000 ක මාසික බිම් කුලිය මත විධිමත් ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමෙන් තොරව 2016 වර්ෂයේ සිට ලබා දී තිබුණි. මේ හේතුවෙන් ආපනශාලාව ටෙන්ඩර් කර ලබා දීම මගින් උපයා ගත හැකිව තිබූ ආදායම රජයට අහිමි වී තිබුණි. | 2021 වර්ෂයේ සිට එම ආපනශාලාව පුවත්පත් මඟින් දැන්වීම් පළකර බදුකුලී පදනම මත ලබාදීමට කටයුතු කර ඇති බව. | රජයට ලබා ගත හැකි ආදායම් කාර්යක්ෂමව උපයා ගැනීමට කටයුතු කළ යුතු වීම.<br>. |
| (ඉ) | ගෙවීම් කිරීමේදී ඉදිකිරීම් සංවර්ධන සහ පුහුණු ආයතනයෙහි (ICTAD) ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනයේ 57 ඡේදය ප්‍රකාරව අවසන් බිල්පත ඉදිරිපත් කර දින 28 ක් ඇතුළත ඉංජිනේරුවරයා විසින් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදල සහතික කළ යුතුය. ඉංජිනේරුවරයාගේ සහතිකය ලැබී දින 21 ක් ඇතුළත කොන්ත්‍රාත්කරුට ගෙවීම් කළ යුතු වුවද, පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ගබඩාවේ වහලය අළුත්වැඩියා කිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ අවසන් බිල 2020 අගෝස්තු 26 දින ගිණුම් අංශයට ඉදිරිපත් කර තිබුණද 2020 ඔක්තෝබර් 27 දින වන විටත් වටිනාකම වූ රු. 2,335,016 ක් ගෙවීම් කර නොතිබුණි. | මෙහිදී ගෙවීම් ප්‍රමාදයට හේතු වූයේ 2020 අගෝස්තු 31 දක්වා පැවති අතුරු සම්මත ගිණුමේ මෙම කාර්යයට අදාළ ගෙවීම් සඳහා ප්‍රතිපාදන නොතිබූ බව. | ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබද සම්මත ලේඛනයන්හි ඇතුළත් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.13 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජකීය උද්භිද උද්‍යානයේ ගබඩා ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම කොන්ත්‍රාත්තුවට අදාළව දෙවන බිල්පත 2019 දෙසැම්බර් 31 දින ඉදිරිපත් කර තිබුණි. එම බිල්පත් ඉංජිනේරුවරයා හෝ ඉංජිනේරුවරයාගේ යටත් තාක්ෂණික නිලධාරියෙකු පරීක්ෂා කිරීමක් සිදු කර නොතිබූ අතර විෂය ලිපිකරු විසින් ප්‍රධාන ගණකාධිකාරිගේ උපදෙස් මත එම මැණුම් පත් සහ බිල් සාරාංශ සංශෝධනය කර ගෙවීම් වවුචර් පිළියෙල කර තිබුණි. එසේම එම බිල්පත අනුව වැඩ බිමෙහි පැවති රු.2,140,162 ක් වටිනා ද්‍රව්‍ය භෞතිකව පරීක්ෂා කර නොතිබුණි. වැඩබිමේ පවතින ද්‍රව්‍ය සඳහා එම ද්‍රව්‍යවල වටිනාකමින් සියයට 80 ක ප්‍රතිශතයක් ලබා දිය හැකි වුවද මෙම කොන්ත්‍රාත්තුවේ අදාළව වැඩබිමේ පවතින ද්‍රව්‍ය සඳහා සම්පූර්ණ මුදලම ගෙවීමට වවුචර් ඉදිරිපත් කර තිබුණි. ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් රු. 918,682 ක් මුදල් රෙගුලාසි 137,138 හා 139 අනුකූල නොවන පරිදි ගෙවා තිබුණි. | ප්‍රතිපාදන ඉතිරිවීම මත සහ කොන්ත්‍රාත්කරු සිදුකළ වැඩ ඉංජිනේරුවරයා වෙතින් වාචිකව විමසා තහවුරු කිරීමෙන් පසු සිදු කරන ලද ගෙවීමක් බවත් මින් ඉදිරියේදී තොග ලේඛන හා අනෙකුත් සියලු ලේඛනද ඉංජිනේරුවරයා පරීක්ෂාකර සහතික කිරීමෙන් පසු ගෙවීමට උපදෙස් දී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් කටයුතු සිදු කළ යුතු වීම. |
| (ආ) රාජකීය උද්භිද උද්‍යානයේ ගබඩා ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ ප්‍රමාණ බිල් පත් හා මැණුම්පත්වල සඳහන් අයිතම අංක 06 අනුව පැති බැම්ම සඳහා ඝන මීටර් 19.85 ක් වෙනුවෙන් රු.260,035 ක් ගෙවීම් කර තිබුණි. 2020 සැප්තැම්බර් 30 දින භෞතික පරීක්ෂාවේදි එහි ප්‍රමාණය ඝන මීටර් 15.9048 ක් විය. ඒ අනුව සත්‍ය වටිනාකම රු. 208,353 ක් වූයෙන් පැති බැම්ම ඒ සඳහා රු. 51,682 ක් වැඩියෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | අයිතම අංක 06 සඳහා රු. 51,682 ක මුදල කොන්ත්‍රාත්කරු වෙතින් අයකර ගැනීමට කටයුතු කර ඇති බව. | ඇස්තමේන්තු අනුව කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීම යටතේ ක්‍රියාත්මක කර තිබූ වැඩසටහන්වලට අදාළව ගම්පහ උද්භිද උද්‍යානයේ වාහන නැවැත්වීමේ පහසුකම් වැඩිදියුණු කිරීම, පුස්තකාලයක් පිහිටුවීම, තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම, උද්භිද විද්‍යා කෞතුකාගාර පිහිටුවීම, ශාක හා සතුන් සම්බන්ධයෙන් වූ විස්තරාත්මක ප්‍රදර්ශන පුවරු සහ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ව්‍යාපෘති යනාදී වැඩහන් ක්‍රියාවට නංවා නොතිබුණි. | 2021 වසරේ සිට තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා වැඩසටහන් රාශියක් ආරම්භ කර ඇති බව. | තිරසර සංවර්ධන අරමුණුවලට අදාළව ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද 2020 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පරිදි තිරසර සංවර්ධන ඉලක්ක ලෙස සියලුම තැන්හි සියලුම ආකාරයේ දුප්පත්කම තුරන් කිරීම, සැමට පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් තහවුරු කර ජීවිත කාලය පුරාවට අධ්‍යාපන අවස්ථා ඇති කිරීම සහ ජෛව විවිධත්වය සංරක්ෂණ, කාන්තාරකරණය පිටු දැකීම, වෘක්ෂලතා සංරක්ෂණය මඟින් පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීම ලෙස (SDG) 03 ක් පිහිටුවා තිබුණද ඉලක්ක සපුරා ගැනීමේදී පිහිටුවා ඇති ඉලක්ක / අරමුණුවලට පරිබාහිරව වෙනත් ඉලක්ක සපුරා තිබුණි. තවද තිරසර සංවර්ධන අරමුණුවල එක් එක් දර්ශකය මැන බැලීම සඳහා මිණුම් දණ්ඩක් හෝ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත | තිරසර සංවර්ධන අරමුණුවල එක් එක් දර්ශකය මැන බැලීම සඳහා මිණුම් දණ්ඩක් හෝ ක්‍රමවේදයක් හඳුනා ගත යුතු වීම. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උද්‍යානවල කටයුතු විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාමට සේවක අවශ්‍යතා සුදුසු අවස්ථාවේදී හඳුනා ගනිමින් අවශ්‍ය අවස්ථාවේ බඳවා ගැනීම් සිදු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 159 ක් පැවතුණි. | අදහස් දක්වා නොමැත. | අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |